# හොරණ රාජකීය විද්‍යාලය
# පළමු වාර පරීක්ෂණය - 2018

| 13 ශ්‍රේණිය | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය | කාලය - පැය 03 |
|---|---|---|

**ප්‍රශ්න 5කට පමණක් පිළිතුරු සපයන්න**

1) i සමූහ සන්නිවේදනයතුල දක්නට ලැබෙන කණ්ඩායම් වර්ග 2ක් දක්වන්න.

ii අවමංගල්‍ය අවස්ථාවකදී දක්නට ලැබෙන නිර්වාචික සන්නිවේදන 4ක් ලියා ඉන් 1ක් විස්තර කරන්න.

iii දැන්වීම්කරණයෙන් ලැබෙන වාසි 3ක් විස්තර කරන්න.

iv "වර්තමාන සමාජයේ ජනමාධ්‍ය පක්ෂග්‍රාහිව කටයුතු කරයි" පුවත්පතකට ලිපියක් ලියන්න.

2) i සමාජයක ලක්ෂණ 4ක් ලියා දක්වන්න.

ii උපභාෂාවක ලක්ෂණ 4ක් ලියා ඉන් 1ක් විස්තර කරන්න.

iii ගෝලීයකරණය සන්නිවේදන ක්ෂේත්‍රයතුල සිදුකර ඇති බලපෑම කරුණු 3ක් ඔස්සේ විස්තර කරන්න.

iv විධිමත් හා අවිධිමත් සන්නිවේදනය සංසන්දනය කරන්න.

3) i භාෂා උපාර්ජනය යන්න කෙටියෙන් දක්වන්න.

ii මහජන සම්බන්ධතා සඳහා යොදාගතහැකි මෙවලම් 6ක් ලියා ඉන් 1ක් විස්තර කරන්න.

iii අධිපතිවාදී සන්නිවේදන සංකල්පයේ ලක්ෂණ 3ක් විස්තර කරන්න.

iv නව මාධ්‍ය සමාජයක යහපත මෙන්ම අයහපත සඳහා ද යොදාගත හැකියි. විමසීමට ලක් කරන්න.



Scanned by CamScanner

4) i භාෂාවේ රූපණය යන්න කෙටියෙන් දක්වන්න.

ii නව මාධ්‍යතුල භාෂාව භාවිතයේ ලක්ෂණ 4ක් ලියා දක්වා ඉන් 1ක් විස්තර කරන්න.

iii ජනමාධ්‍ය තුලින් දරුවකු සමාජානුයෝජනයවන ආකාරය කරුණු 3ක් ඔස්සේ විස්තර කරන්න.

iv පුරවැසි මාධ්‍යවේදියා හා ජනමාධ්‍යවේදියා අයදතන සමාජයේ ජනමාධ්‍යතුල කැපීපෙනෙන කාර්යය භාරයක් ඉටුකරයි. පුරවැසි මාධ්‍යවේදියාගේ ලක්ෂණ හා ජනමාධ්‍යවේදියාගේ ලක්ෂණ සංසන්දනය කරයි.

5) i මහජන සම්බන්ධතා පිළිබඳ බ්‍රිතාන්‍ය නිර්වචනය ලියන්න.

ii ශ්‍රැණ ගවේෂණයේ කාර්යයන් 4 ක් දක්වා ඉන් 1ක් විස්තර කරන්න.

iii සංවර්ධන සන්නිවේදනය පිළිබඳ වූ පෝල් ලැසාස්ෆේල්ඩ් ගේ දෙපියවර විස්තර කරන්න.

iv විකල්ප හා විරෝධාකල්ප මාධ්‍ය වර්තමාන සමාජයේද දක්නට ඇත. විමසන්න.

6) i සංවර්ධන සන්නිවේදනය පිළිබඳ වූ ඩඩ්ලි සියර්ගේ නිර්වචනයේ අඩංගු කරුණු 4ක් ලියන්න.

ii සංවර්ධන පිළිබඳ වූ චීන ආකෘතියේ සඳහන් ප්‍රධාන අංග 4ක් කෙටියෙන් විස්තර කරන්න.

iii තොරතුරු සම්පාදනයේ වැදගත්කම කරුණු 3ක් ඔස්සේ විස්තර කරන්න.

iv සංවර්ධන සන්නිවේදනය ව්‍යාපෘත්යක් ස දහා ප්‍රජා සහභාගීත්වය ලබා ගතහැකි අවස්ථා 4ක් විස්තර කරන්නු.

7) i ගුවන්විදුලි මාධ්‍යතුල භාෂා භාවිතයේදී සැලකිළිමත් වියයුතු කරුණු 4ක් දක්වන්න.

ii සාමාන්‍ය පුවත්පත්වල තොරතුරු වාර්තාකරණය හා අන්තර්ජාලයතුල තොරතුරු වාර්ථාකරණය අතර දැකිය හැකි වෙනස්කම් 4ක් දක්වා ඉන් 1ක් විස්තර කරන්න.

iii නව මාධ්‍ය මිනිසා අතර ජනප්‍රියවීමට හේතු විස්තර කරන්න.

iv රූපවාහිනී මාධ්‍ය තුල ප්‍රචණ්ඩත්වය දැක්වෙන අවස්ථා විස්තර කරන්න.

Scanned by CamScanner